# ෂැංහයි නුවර ආයෝජන සම්මන්ත්‍රණය අමතා අතිගරු ජනාධිපති තුමා විසින් පවත්වනු ලබන කථාව

අපගේ ප්‍රධාන පරිපාලන නගරය වන කොළඹත් සමග සම්බන්ධ කොට තිබෙන්නේ මේ ෂැන්හයි නගරයයි. එම නිසා මෙම ෂැන්හයි නගරයට පැමිණ ඔබ ඇමතීමට ලැබීම මට විශාල සතුටක්.

චීන රටෙන් ගිය චීන ජාතිකයන් බොහෝ දෙනෙක් ජීවත්වන්නේ කොළඹ. ඇතැම් චීන ජාතිකයින් දැන් ශ්‍රී ලංකාවේ පාරම්පරික ව්‍යාපාරිකයන් වී අවසානයි. කොළඹ නගරයේ ඇතැම් වීදි දිගටම චීන අවන්හල් වෙනුවෙන් වෙන් වී ඇති බව කීවොත් ඔබ පුදුම වේවි. ඒ නිසා ඒ චීන ජාතිකයින්ට ෂැන්හයි වලට වඩා කොළඹ පුරුදු බව මම සතුටින් කියන්න ඕනෑ.

අප අතර මිත්‍රත්වය මෑතක ඇතිවූවක් නොවේ. එය දැඩි ඓතිහාසික බැඳීමක්. ලංකාවට සහල් හිඟයක් ඇති වූ හැටේ දශකයේ අප චීනයත් සමග ඇතිකරගත් ගිවිසුම තවමත් අපට මතකයි. ඔබ දේශයෙන් සහල් ලබාගත් අපි ඔබ රටේ කර්මාන්ත සඳහා අවශ්‍ය රබර් ලබාදුන්නා. එම නිසා අපි ඓතිහාසිකවත් හොඳින් ගණු දෙනු කර පුරුදු ජාතියක්. සුප්‍රසිද්ධ ප්‍රකාශයක් තිබෙනවා **"වතුරට වඩා ලේ ඝනකමයි කියලා"** එයින් අදහස් වන්නේ අතීත මිත්‍රත්වයන්, බැඳීම් බලවත් බවයි. එම නිසා චීන යුයැන් රුපියල් බවට පත්වීමත් රුපියල් යුයැන් බවට පත්වීමත් ඉතා පහසු ක්‍රියාවලියක් බවයි මගේ විශ්වාසය.

මේ වන විටත් ශ්‍රී ලංකාවේ විශාල චීන ආයෝජකයින් පිරිසක් සාර්ථකව තම ආයෝජන කරගෙන යනවා. ආයෝජන මණ්ඩල නීතිය යටතේ ප්‍රධාන පෙළේ වානිජ ව්‍යාපෘති 15 පමණත් සාමාන්‍ය නීතිය යටතේ ව්‍යාපෘති 39 පමණත් ලංකාවේ ක්‍රියාත්මක වෙනවා.



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

මෙම ආයෝජන වල මුළු වටිනාකම රුපියල් මිලියන හය දහසකටත් අධිකයි. කුඩා පරිමාන ව්‍යයසායන් සහ තවත් දහස් ගණනක් චීන ව්‍යාපාර ලංකාවේ ක්‍රියාත්මක වෙනවා.

ඒ වගේම  චීනය දැවැන්ත ලෙස නැගී සිටීමට මුල් වූ සංවර්ධන මාවතට ශ්‍රී ලංකාවද ප්‍රවිෂ්ඨ වී තිබෙන බව අපි කියන්න ඕනෑ. නිදහසින් පසු ගිය වැරදි මාවත් අතහැර   ඉතිහාසයේ සංඥාව නිවැරදිව වටහා ගත් අපි පසුගිය ජනාධිපතිවරණයේදී ගම නංවා රට නැංවීමේ ප්‍රතිපත්තියට ජනතා අනුමැතිය ලබා ගත්තා.

ගමෙන් පටන් ගන්නා අපි ගමේ මාර්ග, විදුලිය, අධ්‍යාපනය, තාක්ෂණය ඉතා වේගයෙන් වැඩි දියුණු කිරීම සඳහා අයවැයෙන් ඉතා විශාල ප්‍රතිශතයක් වෙන්කොට අවසන්. එය ලෝකයේ විවිධ ආයෝජකයන් හොඳ යටිතළ පහසුකමක් හැටියට හඳුනා ගන්නවාට අපි කැමතියි.

සුනාමි ව්‍යසනයෙන් ධෛර්ය සම්පන්නව නැගී සිටි අපි සමුද්‍ර ආර්ථිකය ජය ගැනීම අරමුණු කොටගෙන තිබෙනවා. අපට රටේ ගොඩ බිම ආර්ථිකය මෙන් අට ගුණයක් විශාල සමුද්‍ර ආර්ථිකයක් හිමියි. ගම සංවර්ධනය කර රට නගන අපි මේ සමුද්‍ර ආර්ථිකය ජය ගැනීම කෙරෙහි තබා තිබෙන්නේ විශාල විශ්වාසයක්. එහි ගවේෂණ කටයුතු බොහෝ සංවර්ධන ප්‍රතිලාභ ලෝකයට ගෙන එන බව අපට විශ්වාසයි.

ඔබ දන්නවා චීනය නැගී සිටියේ කෘෂිකර්මයෙන් ස්වයංපෝෂිත වූ නිසා. ලෝක ආහාර දුර්භික්ෂයන් හමුවේ, ලෝක අර්බුද හමුවේ චීන ජනතාව කිසිදු විටෙක සාගින්නේ නොසිටියේ කෘෂිකාර්මික ස්වයං පෝෂිත භාවය කෙරෙහි විශ්වාසය තිබූ නිසයි. අපත් කෘෂිකර්මය කෙරෙහි, වී ගොවියා කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදී තිබෙන නිසා වසරින් වසර කෘෂි ක්ෂේත්‍රයේ ඵලදායීතාව ඉහළ නැංවෙන බව ඔබට කිව යුතුයි. ඒ ක්ෂේත්‍රයන්හි කෘෂි උපකරණ සේම නව ආහාර සැකසුම් කර්මාන්ත ඉල්ලමක් පාදන්නට සූදානම් බව අප කිව යුතුයි.



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

අප නවීන හා පුළුල් ලෙස ව්‍යාප්ත කර ඇති අධ්‍යාපන ක්‍රමය මගින් බිහිකොට තිබෙන්නේ ඉතා ශක්තිමත් ශ්‍රම බලකායක්. මේ වෙන කොට ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය 90.7 ක් තරම් ඉහල මට්ටමක පවතිනවා. මේ වසරේ දී පමණක් 15,000 කට වැඩි සිසුන් පිරිසක් විශ්ව විද්‍යාල වලට ඇතුළත් වෙනවා. කාර්මික අධ්‍යාපනය සඳහා සිසුන් 12,000කට අධික පිරිසක් ඇතුල් වෙනවා. මෙමගින් ලැබෙන අධ්‍යාපන සහ වෘත්තීය පුහුණුව නිසා ලොව ඕනෑම ආයතනයක සේවය කළ හැකි කුසලතා පිරි ශ්‍රම බලකායක් අප රටේ සිටිනවා. අප රටේ ශ්‍රම බලකායට විදේශ රටවලින් ද විශාල ඉල්ලුමක් තිබෙන්නේ ඔවුන් නවීන ලෝකයට උවමනා දැනුමින් හා හැකියාවෙන් පරිපූරණ බැවිනි. එය ඔබේ ආයෝජනයේ ඵලදායී බවට ඉමහත් රුකුලක්.

විදුලි හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ, මහාමාර්ග, නිවාස, යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති, සැහැල්ලු ඉංජිනේරු උපකරණ නිෂ්පාදන, කෘෂි සහ මත්ස්‍යය ව්‍යාපාර, මැණික් හා ස්වර්ණාභරණ, මෝටර් වාහන, මෝටර් සයිකල්, රෙදි හා ඇඟලුම් නිෂ්පාදන, සන්නිවේදන වැනි ව්‍යාපාරවල ආයෝජනය සඳහා ඔබට දොර විවෘතව තිබෙනවා.

ඉතා වේගයෙන් නැගී සිටි චීන ජාතිකයින් කෙරෙහි අප ලාංකික ව්‍යාපාරික ප්‍රජාව තුළ තිබෙන්නේ අචල විශ්වාසයක්. ධෛර්යයවන්ත ලෙස කැපවීමෙන් කළ චීනයේ නැගී සිටීම ආසියාතික අපට ආඩම්බරයක්.

එදා සේද මාවතින් විවෘතවූ දොරගුලු ඒ අන්දමටම මේ වනවිට විවෘතව පවතින බව කිව යුතුයි. ඒ ඔස්සේ ලංකාවට ආවොත් ඔබට අතීතයේ ලංකාවේ ඈත ගම් බිම් වල සැහැල්ලු වාහනයක රෙදි අලෙවිකළ චීන ජාතිකයාගේ මෑත පරපුරේ මුණුපුරා දැවැන්ත ඇඟලුම් නිෂ්පාදන කම්හලක් හිමි චීන ව්‍යාපාරිකයකු වී සිටිනු ඔබට දැකගත හැකිය. ඔවුන් හා එක්වන ලෙස මම ඔබගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

***************



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com